# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
# UNIVERSITY OF SRI JAYEWARDENEPURA
## අධ්‍යයන ආයතන අංශය
## Academic Establishment Branch

| | | |
|---|---|---|
| මගේ අංකය :<br>My Number : | ඔබේ අංකය :<br>Your Number : | දිනය : 2024.07.18<br>Date : |

අභ්‍යන්තර චක්‍රලේඛ අංක: AE/IC/2024/01

සියලුම පීඨාධිපතිවරුන්/ අධ්‍යයනාංශ ප්‍රධානීන්/ අංශ ප්‍රධානීන්/ පරිපාලන නිලධාරින් වෙත,

අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා නිවාඩු ලබා ගැනීම

අධ්‍යයන කාර්ය මණ්ඩල, පරිපාලන හා අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල විසින් අයදුම් කරනු ලබන අධ්‍යයන, සප්ත වාර්ෂික හා වෙනත් විදේශ නිවාඩු සඳහා නිවාඩු හා ප්‍රදාන කමිටුවේ නිර්දේශ සහිතව පාලක සභා අනුමැතිය ලබා ගත යුතුය. මේ පිළිබඳව සාකාච්ඡා කළ නිවාඩු හා ප්‍රදාන කමිටුව අදාල කටයුතු විධිමත්ව සිදුකර ගැනීම පහත සඳහන් තීරණ වලට එළඹෙන ලදි.

නිවාඩු අයදුම් කිරීමේදී මේ සමග අමුණා ඇති අයදුම්පත භාවිතා කර නියමිත දින හෝ එදිනට පෙර අධ්‍යයන ආයතන අංශයට ලබා දිය යුතුය.

**ඇමුණුම**

| | |
|---|---|
| සප්ත වාර්ෂික නිවාඩු අයදුම්පත්‍රය | AE/L/01 |
| අධ්‍යයන නිවාඩු අයදුම්පත්‍රය | AE/L/02 |
| සම්මන්ත්‍රණ හා පුහුණු නිවාඩු අයදුම්පත්‍රය | AE/L/03 |
| විවේක නිවාඩු අයදුම්පත්‍රය | AE/L/04 |

විදේශ අධ්‍යයන නිවාඩු ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීමට දින 45ට පෙර අමාත්‍යාංශයට යැවිය යුතු බැවින් අධ්‍යයන නිවාඩු ලබා ගත යුතු දිනට මාස 03ට පෙර අධ්‍යයන ආයතන අංශයට අදාළ නිවාඩු අයදුම්පත්‍රය ලබා දිය යුතු වේ.

මාර්ග ගත ක්‍රමය ඔස්සේ විදේශ නිවාඩු සඳහා, අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීමට පෙර ඒ සඳහා පාලක සභා අනුමැතිය ලබා ගත යුතුය. එහෙත් දින 14ට අඩු විදේශ නිවාඩු සඳහා පාලක සභාවේ ආවරණ අනුමැතියට යටත්ව උපකුලපතිගේ අනුමැතිය ලබා ගත හැකිය. කෙසේ වෙතත් පාලක සභාව හෝ උපකුලපතිගේ අනුමැතිය නොමැති විදේශ නිවාඩු මාර්ග ගත ක්‍රමය ඔස්සේ අමාත්‍යාංශයට අයදුම්කර ඇති අවස්ථාවන්හිදී ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙනු නොලැබේ.

උක්ත තීරණ වලට අනුව කටයුතු කිරීම සඳහා ඔබගේ පීඨයේ/ අධ්‍යයනාංශයේ සියළුම අධ්‍යයන, පරිපාලන හා අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල දැනුවත් කරන මෙන් මෙයින් දන්වා සිටිමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්.එම්. පත්මලාල්
උපකුලපති